(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **48**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 ජූලි 27** බදාදා **පූ.භා. 10.00** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනුෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **දිලුම් අමුණුගම මහතා**

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු සනත් නිශාන්ත මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු ධම්මික පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු ඩී. බී. හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය.  කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාදීම හෝ දිවුරුම්දීම:** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ තෝරා පත්කර ගන්නා ලද පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු වජිර අබේවර්ධන මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේය.

**2. ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශ කථානායකවරයා විසින් කියවන ලදී:—

I

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/13/14

2022 ජුලි මස 17 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි.

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වගන්තිය යටතේ 2022.07.17 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මගින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජුලි මස 18 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාව ගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වාගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ 4 වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - හිතවත්.

**රනිල් වික්‍රමසිංහ**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව වැඩ බලන ජනාධිපති

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2022 ජූලි මස 21 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුවට මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

[signature]
**රනිල් වික්‍රමසිංහ**
ජනාධිපති

**3. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත භාර දී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවනු ලැබේ."

2022 ජූලි මස 21 වන දින

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වී එම පාර්ලිමේන්තු අසුන හිස් කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වශයෙන් අද දින එනම්, 2022 ජූලි මස 21 වැනි දින මා විසින් ජනාධිපති ධුරය භාර ගන්නා ලද බැවින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 66(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් මේ දක්වා දරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වී එම පාර්ලිමේන්තු අසුන හිස් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

**රනිල් වික්‍රමසිංහ**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

II

"නවවැනි පාර්ලිමේන්තුව සඳහා 2022 ජූලි 22 දින සිට බලපැවැත්වෙන පරිදි සභානායක ධූරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා ද ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධූරයට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රසන්න රණතුංග මහතා ද පත් කරනු ලැබ ඇති බව දන්වනු කැමැත්තෙමි."

**4. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ 2018 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවේ මූල්‍ය කළමනාකරණය සහ රාජ්‍ය ණය පාලනය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ දහවැනි කාණ්ඩයේ IV කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXIV සහ XXV කොටස්; සහ

(ii) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXII කොටස, පස්වැනි කාණ්ඩයේ VI කොටස සහ හයවැනි කාණ්ඩයේ XI, XII හා XIII කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ පළාත් පාලන ආයතන වැඩි දියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම සම්බන්ධ කාර්ය සාධන වාර්තාවේ - VIII කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූනි 03 දිනැති අංක 2282/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5, 7 සහ 8 වගන්ති සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජූනි 03 දිනැති අංක 2282/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) 2022 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර එම නියෝග සහ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2021 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(ii) 2021 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(iii) 2021 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2021 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(v) 2021 වර්ෂය සඳහා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(vi) 2021 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2021 වර්ෂය සඳහා කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව; සහ

(viii) 2021 වර්ෂය සඳහා තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(9) කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(11) විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම**:

(1) මාලඹේ, හෝකන්දර උතුර, කහන්තොට පාර, අංක 259/2ඊ, දරන ස්ථානයෙහි පදිංචි ජේ.කේ.එම්. දර්ශනී මහත්මියගෙන් ලැබුණු 2022.06.02 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(2) බණ්ඩාරවෙල, අඹදණ්ඩේගම, කොටුවේ ගෙදර යන ලිපිනයෙහි පදිංචි බී.ඩබ්ලිව්. ඥණවතී මෙනවියගෙන් ලැබුණු 2020.12.17 දිනැති පෙත්සම ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) නුගේගොඩ, ගංගොඩවිල, පරණ කැස්බෑව පාර, අංක 103/8 දරන ස්ථානයෙහි පදිංචි යූ.ඩී. ජනක ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු 2022.06.15 දිනැති පෙත්සම ගරු තිස්ස අත්තනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පාලටුව, ගොඩගම, ලේනදූව හන්දිය, යන ලිපිනයෙහි පදිංචි එන්.ඩී. කරුණාදාස මහතාගෙන් ලැබුණු 2022.03.18 දිනැති පෙත්සම ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) වැලිවේරිය, ඇඹරළුව, අංක 192/1, දරන ස්ථානයෙහි පදිංචි අයි.බී.සෝමපාල මහතාගෙන් ලැබුණු 2021.04.07 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(6) බඩල්කුඹුර, කෙලින් වීදිය, අංක 124/1, දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්.උපුල් නිශාන්ත ගුණතිලක මහතාගෙන් ලැබුණු 2022.06.01 දිනැති පෙත්සම ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ වැඩබලන ජනාධිපතිතුමා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව අනුව) විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන සඳහා වන හදිසි නීති රෙගුලාසි 2022 ජූලි 18 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(පූ.භා.11.26 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

“ගරු (අචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය” යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.57 ට ගරු (අචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

“ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතු ය” යි සෞඛ්‍ය අමාත්‍ය සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.30 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.52 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 120; විරුද්ධව 63; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය හැත්තෑ හත්දෙනෙක් (177) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 002. Douglas Devananda | Yes |
| G 003. Chamal Rajapaksa | Yes |
| G 004. Mahinda Rajapaksa | Yes |
| G 005. Prasanna Ranatunga | Yes |
| G 006. Susil Premajayantha | Yes |
| G 007. Dinesh Gunawardena | Yes |
| G 009. Bandula Gunawardana | Yes |
| G 011. Mahinda Amaraweera | Yes |
| G 012. Wijeyadasa Rajapakshe | Yes |
| G 013. Harin Fernando | Yes |
| G 014. Ramesh Pathirana | Yes |
| G 015. M.U.M. Ali Sabry | Yes |
| G 016. Vidura Wickramanayaka | Yes |
| G 017. Kanchana Wijesekera | Yes |
| G 018. Naseer Ahamed | Yes |
| G 019. Manusha Nanayakkara | Yes |
| G 020. Tiran Alles | Yes |
| G 021. Ajith Rajapakse | Yes |
| G 022. Nalin Fernando | Yes |
| G 023. Roshan Ranasinghe | Yes |
| G 024. Nimal Siripala De Silva | Yes |

| | |
|---|---|
| G 025. Johnston Fernando | Yes |
| G 026. S. B. Dissanayake | Yes |
| G 027. G.L. Peiris | No |
| G 028. Pavithradevi Wanniarachchi | Yes |
| G 029. Gamini Lokuge | Yes |
| G 030. Vajira Abeywardena | Yes |
| G 031. Janaka Bandara Thennakoon | Yes |
| G 032. C. B. Rathnayake | Yes |
| G 033. Dilan Perera | No |
| G 034. Dullas Alahapperuma | No |
| G 035. S. M. Chandrasena | Yes |
| G 036. Mahindananda Aluthgamage | Yes |
| G 037. Rohitha Abeygunawardhana | Yes |
| G 038. Namal Rajapaksa | Yes |
| G 039. Sarath Weerasekera | Yes |
| G 040. Dilum Amunugama | Yes |
| G 042. Mohan Priyadarshana De Silva | Yes |
| G 043. Janaka Wakkumbura | Yes |
| G 044. Shehan Semasinghe | Yes |
| G 045. Kanaka Herath | Yes |
| G 046. Thenuka Vidanagamage | Yes |
| G 047. Nalaka Godahewa | No |
| G 049. Premitha Bandara Tennakoon | Yes |
| G 051. Rohana Dissanayaka | Yes |
| G 052. Premalal Jayasekara | Yes |
| G 053. Arundika Fernando | Yes |
| G 055. Lohan Ratwaththe | Yes |
| G 056. Sanath Nishantha | Yes |
| G 057. Tharaka Balasuriya | Yes |
| G 058. Indika Anuruddha Herath | Yes |
| G 059. Siripala Gamalath | Yes |
| G 061. S. Viyalanderan | Yes |
| G 062. D. V. Chanaka | Yes |
| G 063. Sisira Jayakody | Yes |

| | |
|---|---|
| G 064. Piyal Nishantha De Silva | Yes |
| G 065. Prasanna Ranaweera | Yes |
| G 066. D. B. Herath | Yes |
| G 067. Shasheendra Rajapaksa | Yes |
| G 068. Seetha Arambepola | Yes |
| G 069. Shantha Bandara | Yes |
| G 070. K. Kader Masthan | Yes |
| G 071. Ashoka Priyantha | Yes |
| G 072. A. Aravindh Kumar | Yes |
| G 073. Kapila Athukorala | Yes |
| G 074. Geetha Samanmale Kumarasinghe | Yes |
| G 075. Gayashan Nawananda | Yes |
| G 077. Suren Raghavan | Yes |
| G 078. Diana Gamage | Yes |
| G 080. S. M. M. Muszhaaraff | Yes |
| G 081. Jayantha Ketagoda | Yes |
| G 082. Sampath Athukorala | Yes |
| G 083. Thisakutti Arachchi | Yes |
| G 084. U. K. Sumith Udukumbura | Yes |
| G 085. Pradeep Undugoda | Yes |
| G 086. Sanjeeva Edirimanna | Yes |
| G 087. Akila Ellawala | Yes |
| G 089. Udayana Kirindigoda | No |
| G 090. Jagath Kumara Sumithraarachchi | Yes |
| G 093. Nalaka Bandara Kottegoda | Yes |
| G 095. Udayakantha Gunathilaka | Yes |
| G 096. Kokila Gunawardene | Yes |
| G 097. Milan Jayathilake | Yes |
| G 098. Kulasingam Dhileeban | Yes |
| G 099. Sudarshana Denipitiya | Yes |
| G 100. Isuru Dodangoda | Yes |
| G 101. Premnath C. Dolawatte | Yes |
| G 102. H. Nandasena | Yes |
| G 103. Anupa Pasqual | Yes |

| | |
|---|---|
| G 104. Muditha Prishanthi | Yes |
| G 105. Sudath Manjula | Yes |
| G 106. Mayadunna Chinthaka Amal | Yes |
| G 107. Wasantha Yapabandara | No |
| G 108. Nipuna Ranawaka | Yes |
| G 110. Gunathilaka Rajapaksha | Yes |
| G 112. Upul Mahendra Rajapaksha | Yes |
| G 113. Rajika Wickramasinghe | Yes |
| G 114. M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 115. Madhura Withanage | Yes |
| G 116. Sagara Kariyawasam | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 002. Rajitha Senarathne | No |
| O 004. Tissa Attanayake | No |
| O 005. Rauff Hakeem | No |
| O 006. Gayantha Karunatilleka | No |
| O 007. Lakshman Kiriella | No |
| O 008. Sajith Premadasa | No |
| O 010. Patali Champika Ranawaka | No |
| O 011. Palany Thigambaram | No |
| O 012. Mano Ganesan | No |
| O 015. Selvam Adaikkalanathan | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. A. L. M. Athaullah | Yes |
| O 018. G. G. Ponnambalam | No |
| O 022. Thalatha Athukorala | No |
| O 023. Abdul Haleem | No |
| O 024. Sarath Fonseka | No |
| O 025. Harsha De Silva | No |
| O 028. R. M. Ranjith Madduma Bandara | No |
| O 029. Niroshan Perera | No |
| O 030. Eran Wickramaratne | No |
| O 031. J. C. Alawathuwala | No |
| O 032. Vadivel Suresh | No |

| | |
|---|---|
| O 033. Wimal Weerawansa | Yes |
| O 034. John Seneviratne | Yes |
| O 037. Vijitha Herath | No |
| O 038. Selvarajah Kajendren | No |
| O 040. Ali Sabri Raheem | Yes |
| O 042. Ashok Abeysinghe | No |
| O 043. Ajith Mannapperuma | No |
| O 044. Buddhika Pathirana | No |
| O 045. Nalin Bandara Jayamaha | No |
| O 046. Hector Appuhamy | No |
| O 047. Thushara Indunil Amarasena | No |
| O 048. Velu Kumar | No |
| O 049. Kavinda Heshan Jayawardhana | No |
| O 050. Mayantha Dissanayake | No |
| O 051. K. Sujith Sanjaya Perera | No |
| O 052. S. M. Marikkar | No |
| O 057. Harini Amarasuriya | No |
| O 060. Sivagnanam Shritharan | No |
| O 061. Imran Maharoof | No |
| O 062. Mujibur Rahuman | No |
| O 063. Harshana Rajakaruna | No |
| O 064. Rohini Kumari Wijerathna | No |
| O 065. Chaminda Wijesiri | No |
| O 066. Waruna Liyanage | No |
| O 067. M. Udayakumar | No |
| O 068. Hesha Withanage | No |
| O 069. W. H. M. Dharmasena | No |
| O 070. Kins Nelson | No |
| O 071. Rohana Bandara | No |
| O 073. Jayarathna Herath | Yes |
| O 077. M. A. Sumanthiran | No |
| O 078. Charles Nirmalanathan | No |
| O 079. S. Rajaputhiran Rasamanickam | No |
| O 080. Thavaraja Kalai Arasan | No |

| | |
|---|---|
| O 082. M. S. Thowfeek | No |
| O 083. Ishak Rahuman | No |
| O 088. Nimal Lanza | Yes |
| O 090. Jeevan Thondaman | Yes |
| O 092. Mohomad Muzammil | Yes |
| O 094. Asanka Navarathna | Yes |
| O 095. Nimal Piyathissa | Yes |
| O 096. Uddika Premarathne | Yes |
| O 097. M. Rameshwaran | Yes |
| O 098. Gamini Waleboda | Yes |
| O 100. Gevindu Cumaratunga | Yes |
| O 101. D. Weerasingha | Yes |
| O 102. Samanpriya Herath | Yes |
| O 103. Yadamini Gunawardena | Yes |
| O 104. Manjula Dissanayake | Yes |
| O 105. Ranjith Bandara | Yes |
| O 108. Marjan Faleel | Yes |
| O 109. Lalith Varna Kumara | Yes |
| O 110. S. Jagath Samarawickrama | Yes |
| O 113. Chamara Sampath Dasanayake | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව මහ ලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් හය දෙනෙකු (06) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Keheliya Rambukwella | Yes |
| Dhammika Perera | Yes |
| Jayantha Weerasinghe, PC | Yes |
| Kabir Hashim | No |
| (Dr.) V. Radhakrishnan | No |
| Dilip Wedaarachchi | No |

**8. කල් තැබීම:** එකල්හි වේලාව අ.භා 4.30 පසුකර තිබුයෙන්, අ.භා. 5.35 ට අද දින සභා සම්මතිය අනුව කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 අගෝස්තු 09 අඟහරුවාදා පූ. භා. 10.00 වනතෙක් කල් ගියේය.